**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**නීති කටයුතු දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත අධ්‍යක්ෂ (නීති) තනතුරට පත්කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය**

නීති කටයුතු දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත අධ්‍යක්ෂ (නීති) තනතුරේ පවතින පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා දෙපාර්තමේන්තුව තුළ දැනට සක්‍රිය සේවයේ නියුතු, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නීති නිලධාරි I ශ්‍රේණියේ නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් එක් අයෙක් අධ්‍යක්ෂ (නීති) දෙපාර්තමේන්තුගත තනතුර සඳහා පත් කරනු ඇත.

**1. බඳවා ගැනීමේ ක්‍රමය :-**

මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. මෙම තනතුරට පත්කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ඇති අතර, පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කෙරෙනු ඇත.

**2. සපුරාලිය යුතු සුදුසුකම්**

**i. වෘත්තිය සුදුසුකම්**

නීති නිලධාරි හෝ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරි I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

**ii. කායික සුදුසුකම්**

විශිෂ්ඨ චරිතයකින්,මනා පෞර්ෂයකින් හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**iii. වෙනත් සුදුසුකම්**

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍ර ලේඛ 01/2020 හා ඊට අනුශාංගික චක්‍ර ලේඛ අනුව විනය දඬුවමක් ලබා නොතිබීම.

**3. වැටුප් ක්‍රමය :-**

2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 10/2025හි විධිවිධානයන්ට අනුව SL 1- 2025 වැටුප් ඛණ්ඩයට අදාල වැටුප් පරිමාණය එනම්, රු. 82,150 - 10 x 2,400 - 8 x 2,940 - 17 x 3,900 - 195,970/- වේ.

**4.** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පරිපාටිය පදනම් කර ගනු ලැබේ.

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂය | ලබාදෙන ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|
| **1. කාර්ය සාධනය (2026.06.01 දිනට පෙර වසර 05ක කාර්ය සාධනයන් සලකා බැලේ.)** | | 25 |
| කාර්ය සාධනය - ඉතා හොඳයි | 05 (වසරක් සඳහා) | |
| කාර්ය සාධනය - හොඳයි | 03 (වසරක් සඳහා) | |
| කාර්ය සාධනය - සතුටුදායකයි | 01 (වසරක් සඳහා) | |
| **2. අතිරේක වෘත්තීය සුදුසුකම්** | | 25 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව වසර 10 කට වැඩි සක්‍රීය වෘත්තීය සේවා කාලයට අමතරව සේවා කාලය | වසර 10ට වැඩි එක් වර්ෂයකට ලකුණු 02 බැගින් උපරිමය 20 | |
| නොතාරිස් ධුරයේ සිංහල හා ඉංග්‍රිසි භාෂාවෙන් කටයුතු කිරීම. | සිංහල - 2 $^{1}/_{2}$<br>ඉංග්‍රිසි - 2 $^{1}/_{2}$ | |
| **3. අතිරේක අධ්‍යාපන සුදුසුකම් (ඉහලම අමතර සුදුසුකම මත ලකුණු ලබාදේ.)** | | 10 |
| නීතිය සම්බන්ධ පශ්චාත් උපාධියට අමතර වෙනත් පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම | 10 | |
| **4. තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම** (ඉහලම සුදුසුකම මත ලකුණු ලබාදේ.) | | 10 |
| පිළිගත් ආයතනයක් මගින් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ වසරක පාඨමාලාවක් හදාරා තිබීම | 10 | |
| පිළිගත් ආයතනයක් මගින් තොරතුරු තාක්ෂණය පිළිබඳ අවම මාස 06 ක පාඨමාලාවක් හදාරා තිබීම | 05 | |
| **5. භාෂා ප්‍රවීණතාවය** | | 10 |
| පිළිගත් ආයතනයක් මගින් ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් හෝ වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම | 05 | |
| පිළිගත් ආයතනයක් මගින් දෙමළ භාෂාව පිළිබඳ (අවම මාස 06) පාඨමාලාවක් හදාරා තිබීම. | 05 | |
| **6. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය** | | 20 |
| පෙන්නුම් කරන සන්නිවේදන කුසලතා | 10 | |
| පෞර්ෂත්වය | 10 | |
| **එකතුව** | | 100 |

**5.** **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි**

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමට හැකි විය යුතුය.

**6. අයදුම්පත් ඉදිරිපත් කිරීම**

සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර සුදුසුකම්ලත් අයදුම්කරුවන් [www.treasury.gov.lk](http://www.treasury.gov.lk) වෙබ් අඩවියේ ඇති අයදුම්පත නිසිලෙස සම්පූර්ණ කර 2026.10. 09 දිනට හෝ ඊට පෙර ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, කොළඹ 01 යන ලිපිනයට පැමිණ භාරදෙන ලෙස හෝ ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතු අතර අයදුම්පත් අඩංගු කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"අධ්‍යක්ෂ "නීති" -** දෙපාර්තමේන්තුගත තනතුර " යන්න සඳහන් කර එවිය යුතුය. සුදුසුකම් සනාථ කිරිම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

අයදුම්කරුවන් නිරවද්‍ය හා සත්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු / ඇය ගේ පත්වීම අවලංගු කිරීමට කටයුතු කරනු ඇත.

නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති, මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේෂකත්වය අවලංගු කරනු ලැබේ.

**7. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය**

අපේක්ෂකයින් තම අනන්‍යතාවය සනාථ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය යන ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලේඛන වල මුල් පිටපත් ද, එම ලේඛන වල ඡායා පිටපත් කට්ටලයක් ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

**8.** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියළුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ලේකම්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
මහ භාණ්ඩාගාරය
කොළඹ 01